මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone මතුගම

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

| පෙරදිග සංගීතය | 6 ශ්‍රේණිය | කාලය : පැය 02 යි |
|---|---|---|

නම:.................................................................................................................................................

## I කොටස

- සියලුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- **අංක 01 සිට 10 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) සංගීතයේ මාධ්‍ය වන්නේ,

1. අංගචලනයයි. 2. නාද හා ස්වරයි.
3. අභිනයයි. 4. රේඛා හා වර්ණයි.

(2) පෙරදිග සංගීතයේ භාවිතා වන ශුද්ධ ස්වර ගණන,

1. 5 කි. 2. 6 කි. 3. 7 කි. 4. 8 කි.

(3) ස රි ග, රි ග ම, ....... යන ස්වර අභ්‍යාසයේ ඊළඟට යෙදෙන ස්වර ඛණ්ඩය වන්නේ,

1. රි ග ප 2. ග ම ප 3. ග ප ධ 4. ම ප ධ

(4) සඩ්ජය සහ පංචමය ලෙස හඳුන්වන්නේ,

1. ස සහ ප ස්වරයි. 2. ස සහ ග ස්වරයි.
3. ප සහ ස ස්වරයි. 4. ස සහ ම ස්වරයි.

(5) Re (රේ) ලෙස නම් කරන අපරදිග ස්වර නාමයට අදාළ පෙරදිග ස්වර සංකේතය වන්නේ,

1. ස 2. රි 3. ග 4. ම

(6) සසස / රිරිරි / ග - රි / ස - - ලෙස ස්වර යෙදෙන ශුද්ධ ස්වර ස්ථාපන ගීතය වන්නේ,

1. හොඳ දේ සිතමී සිතු දේ කියමී 2. ගී ගයන මේ කුරුළු යාළුවන් හා
3. එකට සතුටු සාගරේ 4. කඳුපෙළ අතරේ තුරු වදුලේ

(7) 'මිස්රාබ්' නම් උපකරණය ආධාරයෙන් වයන සංගීත භාණ්ඩය වන්නේ,

1. වයලීනය 2. සිතාරය
3. එස්රාජය 4. ගිටාරය

(8) තත් වාදන භාණ්ඩයක් නොවන්නේ,

1. වයලීනය 2. මැන්ඩලීනය
3. බටනලාව 4. එස්රාජය

(09) ශ්‍රී ලංකා ජාතික ගීයේ නිර්මාතෘවරයා වන්නේ,

1. ඩබ්.ඩී. අමරදේව මහතා 2. ආනන්ද සමරකෝන් මහතා
3. සුනිල් ශාන්ත මහතා 4. වික්ටර් රත්නායක මහතා

(10) සුවඳ පද්ම ඕලු ආදි යනු,

1. ශුද්ධ ස්වර ස්ථාපන ගීතයකි. 2. දේශාභිමානී ගීතයකි.
3. කෙළි ගීයකි. 4. නූර්ති ගීයකි.

- ප්‍රශ්න **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා A හා B තීරු නිවැරදි ලෙස ගලපන්න.**

| | A | B |
|---|---|---|
| (11) | සෙන්පතියන් ගැන නැව්පතියන් ගැන | බැතිනා සිරිපා කරුණා කරනා |
| (12) | පික් එකෙන් වාදනය කරයි. | වයලීනය |
| (13) | බෝ එකක් ආධාරයෙන් වාදනය කරයි. | අහසට පිඹිනා එරන් කළේයා. |
| (14) | ශුද්ධ ස්වර ස්ථාපන ගීතයකි. | ගිටාරය |
| (15) | කළගෙඩි සෙල්ලමට අයත් ගී පාදයකි. | ළමා ගීයකි. |

- ප්‍රශ්න **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති ප්‍රකාශයන් හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

(16) වයලීනය තත් 4කින් යුත් භාණ්ඩයකි. ( )

(17) උච්ච ස්වර හඳුනා ගැනීමට ස්වරයට යටින් තිතක් තබයි. ( )

(18) ළමා ගීතවල සරල භාෂාවක් දක්නට නොලැබේ. ( )

(19) බටනලාව සුෂිර වාද්‍ය භාණ්ඩ වර්ගයට අයත් වේ. ( )

(20) තබ්ලාව තාල වාද්‍ය භාණ්ඩයකි. ( )

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

| පෙරදිග සංගීතය | 6 ශ්‍රේණිය |
|---|---|

නම:..........................................................................................................................................

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

(01) (i) පෙරදිග සංගීතයේ භාවිතා වන ශුද්ධ ස්වර හත ආරෝහණ හා අවරෝහණ වශයෙන් ලියා දක්වන්න. (ල. 2)

(ii) ස්වර පුවරුවක් ඇඳ ස්වර සප්තකය ලකුණු කරන්න. (ල. 6)

(iii) පහත සඳහන් ස්වරවලට අදාළ පෙරදිග ස්වර නාමය ලියන්න.

රි -

ග -

ප -

නි - (ල. 4)

(02) (i) ශ්‍රී ලංකා ජාතික ගීය ගයනු ලබන අවස්ථා 2ක් නම් කරන්න. (ල. 2)

(ii) ජාතික ගීය ගායනා කරනු ලබන අවස්ථාවලදී අනුගමනය කළයුතු කරුණු 02 ක් ලියන්න. (ල. 2)

(iii) ජාතික ගීයේ පද පෙළ සම්පූර්ණයෙන් නිවැරදිව ලියා දක්වන්න. (ල. 8)

(03) (i) ස, රි යන ස්වර දෙක පමණක් යොදා ගනිමින් නිර්මාණය කළ ස්වර ස්ථාපන ගීතයක මුල් පද පේළිය ලියන්න. (ල. 1)

(ii) ඔබ උගත් ස්වර ස්ථාපන ගීතයක් ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ල. 8)

(iii) සරිගම, රිගමප යන ස්වර අභ්‍යාසයේ ඊළඟට යෙදෙන ස්වර ඛණ්ඩ තුන පිළිවෙළින් ලියන්න. (ල. 3)

(04) (i) තත් වාද්‍ය භාණ්ඩ 4 ක් නම් කරන්න. (ල. 4)

(ii) Bow (බෝ) එකක් ආධාරයෙන් නාදය නිපදවන භාණ්ඩ 02ක් නම් කරන්න. (ල. 2)

(iii) ඔබ කැමති සංගීත භාණ්ඩයක් නම් කර එහි දළ රූප සටහනක් ඇඳ සුවිශේෂී 04ක් ලියන්න. (ල. 6)

(05) (i) ඔබ දන්නා ළමා ගීතයක ස්ථායී කොටස ලියා දක්වන්න. (ල. 2)

(ii) ළමා ගීතයක තිබිය යුතු ලක්ෂණ 4ක් ලියන්න. (ල. 4)

(iii) හඳ මාමා, වැස්ස, අම්මා යන මාතෘකා අතරින් එක් මාතෘකාවක් තෝරාගෙන ගී පද මාලාව නිර්මාණය කරන්න. (ල. 6)

(06) (i) කෙළි ගී වර්ගයට අයත් ගී වර්ග 04 ක් නම් කරන්න. (ල. 4)

(ii) ඒ අතරින් ඔබ තෝරාගත් කෙළි ගී වර්ග දෙකකට අදාළ කවි දෙකක් ලියා දක්වන්න.(ල. 6)

(iii) කෙළි ගීවල දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණ දෙකක් ලියන්න. (ල. 2)

(07) (i) නූර්ති නාට්‍ය 02 ක් නම් කර ඒවායේ නිෂ්පාදකවරුන් නම් කරන්න. (ල. 4)

(ii) ඔබ දන්නා නූර්ති ගීතයක ස්ථායි කොටස ලියා දක්වන්න. (ල. 5)

(iii) නූර්ති නාට්‍ය ගීත සඳහා යොදාගත් සංගීත භාණ්ඩ 03 ක් නම් කරන්න. (ල. 3)

## මතුගම අධ්‍යාපන කලාපය - දෙවන වාර පරීක්ෂණය - 2023
## පෙරදිග සංගීතය - 6 ශ්‍රේණිය

### <u>පිළිතුරු පත්‍රය</u>


### I කොටස

| | | | |
|---|---|---|---|
| (01) | 2 | (11) | ළමා ගීතයකි. |
| (02) | 3 | (12) | ගිටාරය |
| (03) | 2 | (13) | වයලීනය |
| (04) | 1 | (14) | බැතිනා සිරිපා කරුණා කරනා |
| (05) | 2 | (15) | අහසට පිඹිනා එරන් කළේයා |
| (06) | 3 | (16) | ✓ |
| (07) | 2 | (17) | × |
| (08) | 3 | (18) | × |
| (09) | 2 | (19) | ✓ |
| (10) | 4 | (20) | ✓ |

### II කොටස

(01) (i) ආරෝහණ - ස රි ග ම ප ධ නි ස්̇

අවරෝහණ - ස̣ නි ධ ප ම ග රි ස (ල. 1 x 2 = 2)

(ii) 


(ල. 6)

(iii) රි̣ - රිෂභය
ග - ගාන්ධාරය
ප - පංචමය
නි - නිෂාදය (ල. 1 x 4 = 4)

(02) (i)
- ජාතික නිදහස් දින උත්සවවලදී
- රාජ්‍ය උත්සවවලදී
- පාසලේ විශේෂ උත්සවවලදී
- පාසල් නිවාසාන්තර ක්‍රීඩා උත්සවවලදී

ආදී අදාළ කරුණුවලින් 02ක් සඳහන් කළ යුතු ය. (ල. 2)

(ii)
- සීරුවෙන් සිට ගැනීම.
- දෙපා V අකුරක ආකාරයට තබා ගැනීම.

- ඇස් මට්ටමින් ඉදිරියේ බලා සිටීම.
- නිශ්ශබ්දව සිටීම.
- ආදී අදාළ කරුණුවලින් 02ක් සඳහන් කළ යුතු ය. (ල. 2)

(iii) ජාතික ගීයේ පද මාලාව සම්පූර්ණයෙන් නිවැරදිව ලිවිය යුතුය. (ල. 8)

(03) (i) හොඳ දේ සිතමී / ගී ගයන මේ කුරුළු යාළුවන් හා.... යන ගීත දෙකෙන් එකක් නම් කර තිබිය යුතු ය. (ල. 1)

(ii) ශුද්ධ ස්වර ස්ථාපන ගීතයක ස්වර හා පද නිවැරදිව ප්‍රස්තාර කර තිබිය යුතු ය. (ල. 8)

(iii) ගමපධ, මපධනි, පධනිස (ල. 3)

(04) (i) වයලීනය/සිතාරය/ගිටාරය/එස්රාජය/මැන්ඩලීනය ආදී තත් භාණ්ඩවලින් 04ක් නම් කළ යුතු ය. (ල. 4)

(ii) වයලීනය/එස්රාජය/දිල්රුබාව යන භාණ්ඩවලින් 02ක් නම් කළ යුතුය. (ල. 2)

(iii) දළ රූප සටහන (ල. 2)
භාණ්ඩයට අදාළ සුවිශේෂී කරුණු 04 ක් ලියා තිබිය යුතු ය. (ල. 4)

(05) (i) ළමා ගීතයක ස්ථායී කොටස නිවැරදිව ලියා තිබිය යුතුය. (ල. 2)

(ii)
- භාෂාව සරළ ය.
- නාද මාලාව සරල ය.
- නර්තනශීලී රිද්මයකින් යුක්ත වේ.
- ළමා ලෝකයට ගැළපෙන සරල තේමාවන්ගෙන් යුක්ත විය යුතුයි.
- ළමා ලෝකයට ගැළපෙන ආදර්ශ ලබා දිය යුතු ය.

ආදී ලක්ෂණ 04ක් සඳහන් කළ යුතු ය. (ල. 4)

(iii) දී ඇති මාතෘකාවලින් එක් මාතෘකාවක් තෝරාගෙන ගී පද කොටස් (පේළි 4කට නොඅඩු) නිර්මාණය කර තිබිය යුතු ය. (ල. 6)

(06) (i) ඔළිඳ කෙළිය
මේවර කෙළිය
එළුවන් කෑම
කළගෙඩි සෙල්ලම (ල. 4)

(ii) ගී වර්ග දෙකකට අදාළව කවි දෙකක් ලිවිය යුතු යි. (ල. 8)

(iii) කෙළි ගී වල ලක්ෂණ දෙකක් ලිවිය යුතුයි. (ල. 2)

07. (i) නූර්ති නාට්‍ය දෙකක් හා ඊට අදාළ නිෂ්පාදකවරුන් දෙදෙනෙකු නම් කර තිබිය යුතුයි.
දුටුගැමුණු - නීතීඥ ජෝන් ද සිල්වා
වෙස්සන්තර - නීතීඥ ජෝන් ද සිල්වා
විදුර - නීතීඥ චාල්ස් ඩයස් (ල. 4)

(ii) නූර්ති ගීතයක ස්ථායී කොටස නිවැරදිව ලියා තිබිය යුතුයි. (ල. 5)

(iii) සර්පිනාව, තබ්ලාව, වයලීනය (ල. 3)

II කොටස
මුළු ලකුණු - ප්‍රශ්න 05 සඳහා 12 බැගින් 60 කි.



LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
T
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න